# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2054/41 - 2018 ජනවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2018.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 03/2018 දරන සුරාබදු නිවේදනය

**සුරාබදු බලපත්‍ර ස්ථාන විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන්**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 32 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මඟින් පහත උපලේඛනයෙහි දක්වෙන සුරාබදු බලපත්‍ර ස්ථාන විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන් 2018 ජනවාරි මස 18 වැනි දින සිට බලාත්මක බව ප්‍රකාශ කරමි.

2018 ජනවාරි මස 10 දිනැති අංක 2053/21 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 01/2018 දරන සුරාබදු නිවේදනය සහ 1981 පෙබරවාරි මස 02 දිනැති අංක 126/3 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 686 දරන සුරාබදු නිවේදනය පරිච්ඡින්න විය යුතු ය.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|
| | *බලපත්‍ර වර්ගය* | *විවෘතව තැබිය යුතු වේලාවන්* |
| 1. | රට බීම තැබෑරුම් බලපත්‍රය | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 8.00 |
| 2. | රා තැබෑරුම් | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 8.00 |
| 3. | හෝටල් බලපත්‍ර (ර. බී. 07) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 11.00 |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| I වැනි තීරුව | | II වැනි තීරුව |
|---|---|---|
| බලපත්‍ර වර්ගය | | විවෘතව තැබිය යුතු වේලාවන් |
| | | |
| 4. | හෝටල් පීයිකා බලපත්‍ර (ර. බී. 08) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 11.00 |
| 5. | හෝටල් බලපත්‍ර (ර. බී. 07) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත | පෙ. ව. 10.00 - මධ්‍යම රාත්‍රී 12.00<br>(අවශ්‍ය වන්නේ නම් බලපත්‍රකරුගේ ඉල්ලීම මත අළුයම 02.00 දක්වා අතිරේක බලපත්‍ර වල වේලාව දීර්ඝ කිරීමට ක්‍රියා කරනු ඇත) |
| 6. | හෝටල් පීයිකා බලපත්‍ර (ර. බී. 08) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත | |
| 7. | සිනමා ශාලා සඳහා ලබා දෙන විනෝද පීයිකා බලපත්‍ර (ර. බී. 09) | පෙ. ව. 11.00 සිට ප. ව. 1.00 සහ<br>ප. ව. 5.00 සිට ප.ව. 11.00<br>(දර්ශන පෙන්වන අවස්ථාවල දී පමණි) |
| 8. | ආපනශාලා බලපත්‍ර (ර. බී. 11) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 10.00 |
| 9. | ආපනශාලා බලපත්‍ර (ර. බී. 11) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 11.00 |
| 10. | පරිශ්‍රය තුළ දී පරිභෝජනය කරන බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් බලපත්‍ර (ර. බී. 22 බී) (සංචාරක මණ්ඩල අනුමැතිය රහිත පරිශ්‍රයන් සඳහා) | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 10.00 |
| 11. | පරිශ්‍රය තුළ දී පරිභෝජනය කරන බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් බලපත්‍ර (ර. බී. 22 බී) (සංචාරක මණ්ඩල අනුමැතිය සහිත පරිශ්‍රයන් සඳහා) | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 11.00 |
| 12. | තානායම් බලපත්‍ර (ර. බී. 12) | පෙ. ව. 11.00 සිට ප. ව. 11.00 |
| 13. | දුම්රිය ආපනශාලා බලපත්‍ර (ර. බී. 10) | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 8.00 |
| 14. | සමාජ ශාලා බලපත්‍ර (ර. බී. 13 ඒ) (සාමාජිකයින් සඳහා පමණයි) | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 11.00 |
| 15. | හිමිකාර සමාජශාලා බලපත්‍ර (ර. බී. 13) | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 සහ<br>ප. ව. 5.00 සිට ප. ව. 11.00 |
| 16. | විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (ර. බී. 04) | පෙ. ව. 8.00 සිට ප. ව. 08.00 හෝ<br>පෙ. ව. 9.00 සිට ප. ව. 09.00 |
| 17. | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (ර. බී. 22 ඒ) | |

02 - 161

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.